**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2016/17**
**SOC 3267 - අධ්‍යාපනය සහ සමාජය**
**පැ දෙක (02) යි**

**ඕනෑම ප්‍රශ්න <u>තුන(03)</u> කට පිළිතුරු සපයන්න.**

---

1. ‘කිසියම් රටක අධ්‍යාපනය සහ සංස්කෘතිය අතර ඇත්තේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් වුවද සංස්කෘතියට අධ්‍යාපනය කෙරෙහි කළ හැකි බලපෑම අධ්‍යාපනයට සංස්කෘතිය කෙරෙහි කළ හැකි බලපෑමට වඩා ප්‍රබල වූවකි.’ මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

2. ‘පාසල, පවුලත් පුළුල් සමාජයත් අතර පාලමක් ලෙස ක්‍රියාත්මක වනවාය’ යන කෘත්‍යවාදී මතය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

3. ‘දැනුම ලබා ගැනීම සඳහා වර්තමානයේ ඇති විකල්ප මාර්ග හමුවේ පාසලට සාම්ප්‍රදායිකව හිමි ව තිබූ වැදගත්කම අඩු වී ඇත.’ අධ්‍යාපනය පිළිබඳ ලිබරල්වාදී අදහස් ඇසුරින් විචාරාත්මකව සාකච්ඡා කරන්න.

4. ‘කිසියම් සමාජයක වඩාත් කැපී පෙනෙන ලාක්ෂණික එම සමාජයේ පාසල් පද්ධතිය තුළින්ද දැකගත හැකිය.’ ඔබ එකඟ වනවාද? ඔබගේ පිළිතුර උදාහරණ ඇසුරින් පහදන්න.

5. ශ්‍රී ලංකාව තුළ සිසුන්ගේ ශාස්ත්‍රීය සාධන මට්ටම් තීරණය කිරීමෙහි ලා සමාජ පන්තිය තවමත් වැදගත් සාධකයක් වේ. මෙම තත්වය අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක වන සමානාත්මතා ප්‍රතිපත්තිවල දුර්වලතාවක් ලෙස අනිවාර්යයෙන් සැළකිය හැකිද? උදාහරණ දක්වමින් විචාරාත්මකව විභාග කරන්න.

6. ගුරුවරයාට පාසල තුළත් ඉන් පිටතත් තමාට පැවරී ඇති භාරදූර සමාජ වගකීම පිළිබඳ පවත්නා අවබෝධය ප්‍රමාණවත් නොවන බවට වත්මන් පාසල් පද්ධතිය තුළ දැකගත හැකි ඇතැම් අවකල්ක්‍රියා සාක්ෂි සපයයි. මෙම ගැටළුව නිරාකරණය කරගත හැකි පරිදි ගුරුවරු පුහුණු කළ හැක්කේ කෙසේද? සාකච්ඡා කරන්න.

***************************